# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1856/5 - 2014 මාර්තු මස 31 වැනි සඳුදා - 2014.03.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. – බී. 21/1978(xii).

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

27 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන අමාත්‍ය, දිසානායක මුදියන්සේලාගේ සුමනවීර බණ්ඩා දිසානායක වන මම, මේ නියමය මගින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය ඇතිව, කලින් කල සංශෝධිත රජරට විශ්වවිද්‍යාලය හා සම්බන්ධවූ 1995 නොවැම්බර් මස 07 වැනි දින හා අංක 896/2 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළවූ නියමය සහ 2010 ජුනි මස 17 වැනි දින අංක 1658/36 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමය මගින් අවසන් වරට සංශෝධිත, ඉහත කී පනතේ 21 වැනි වගන්තිය යටතේ සාදන ලද නියමය එහි උපලේඛනයේ I වැනි තීරයේ දැක්වෙන "පීඨය" යන ශීර්ෂය යටතේ දැක්වෙන "කෘෂිකර්ම පීඨය" යන අයිතමය සහ ඊට අනුරූපීව II වැනි තීරයේ "අධ්‍යයන අංශ" යන ශීර්ෂය යටතේ දැක්වෙන සියලුම අයිතම ඉවත්කර පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්, එම නියමයේ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ. :—

| "*I වැනි තීරය* | *II වැනි තීරය* |
|---|---|
| ***පීඨය*** | ***අධ්‍යයන අංශ*** |
| කෘෂිකර්ම පීඨය | 1. සත්ත්ව පාලන හා ආහාර විද්‍යා අධ්‍යයන අංශය |
| | 2. කෘෂි ඉංජිනේරු හා පාංශු විද්‍යා අධ්‍යයන අංශය |
| | 3. කෘෂිකර්ම පද්ධති අධ්‍යයන අංශය |
| | 4. ශාඛ විද්‍යා අධ්‍යයන අංශය" |

දිසානායක මුදියන්සේලාගේ සුමනවීර බණ්ඩා දිසානායක,
උසස් අධ්‍යාපන අමාත්‍ය.

2014 මාර්තු මස 27 වැනි දින,
කොළඹ දීය.

04-414